**සුරාබදු ආඥාපනත**

**අංක 02/2018 දරන සුරාබදු නිවේදනය**

**සුරාබදු නිවේදන අංක 666 හි දැක්වෙන කොන්දේසි සංශෝධනය**

කලින් කලට සංශෝධනය කරන පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 1979 දෙසැම්බර් මස 31 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 666 දරන සුරාබදු නිවේදනයෙහි උපලේඛනය,

(1) 5 වැනි ඡේදයේ (v) උප ඡේදය අවලංගු කර ඒ වෙනුවට පහත දැක්වෙන උප ඡේදය ආදේශ කිරීම,
“ (v) වයස අවුරුදු 18 ට අඩු ඕනෑම පුද්ගලයකු ”,

(2) ඡේද අංක 11 හි උප ඡේද (ඇ) ඉවත් කිරීම, සහ

(3) ඡේද අංක 11 හි උප ඡේද (ඈ) උප ඡේද (ඇ) ලෙස නැවත අංකනය කිරීම

මඟින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018.01.10 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.